උසස් පෙළින් සරසවියට

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

උසස් පෙළ ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2025

| ක්‍රිස්තියානි ධර්මය | 12 ශ්‍රේණිය | 43 | S | I | කාලය පැය 3යි මිනි.10යි |
|---|---|---|---|---|---|

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

1. ශුද්ධ බයිබලයේ මැසරොටික් පිටපත පරිශීලනය කරන අය වන්නේ.

   1/ ජුදා හා ක්‍රිස්තියානි. 2/ කතෝලික සහ ජුදා. 3/ කතෝලික සහ රෙපරමාදු. 4/ ජුදා සහ රෙපරමාදු. 5/ ක්‍රිස්තියානි හා කතෝලික.

2. 'ජුදෙව්වරුන් සමඟ සංවාදය' නැමැති කෘතියෙහි ජුදෙව්වරුන් ශුද්ධ ලියවිල්ල කපා හැර ඇති බවට චෝදනා කරන්නේ,

   1/ ශුද්ධවූ සිරිල් තුමා. 2/ ශුද්ධවූ ජස්ටින් තුමා. 3/ ශුද්ධවූ අගුස්තීනු තුමා. 4/ ශුද්ධවූ ටර්ටූලියන් තුමා. 5/ ශුද්ධවූ ඔරිගන් තුමා.

3. නව ගිවිසුමේ කෘතීන් වැඩි සංඛ්‍යාවක් ලේඛනගත කළ කතුවරයා ලෙස කිරුළ හිමිකර ගත්තේ,

   1/ ශුද්ධවූ පේදුරු තුමාය. 2/ ශුද්ධවූ පාවුළු තුමාය. 3/ ශුද්ධවූ ජොහාන් තුමාය. 4/ ශුද්ධවූ ලූක් තුමාය. 5/ ශුද්ධවූ මාර්ක් තුමාය.

4. "ඇපොකලිප්ස්" යන ග්‍රීක වචනයේ අර්ථය.

   1/ දිව්‍ය සංරක්ෂණය. 2/ ප්‍රඥාව. 3/ පොත් මාතාව. 4/ අනාවරණය. 5/ අභිරහස්.

5. එලියා දිවැසිවරයා හා බාල් පූජකයන් පිළිබඳ සිද්ධිය සිදු වූ කාර්මෙල් කඳුගැටය පිහිටි මිටියාවත වූයේ

   1/ ශාරොන් මිටියාවත 2/ අක්කෝ මිටියාවත. 3/ පිලිස් මිටියාවත. 4/ එස්ඩ්‍රාලෝන් මිටියාවත. 5/ ජෝර්දාන් මිටියාවත.

6. පේදුරුතුමා විවිධ සත්වයන්ගෙන් සමන්විත රුවලක් පිළිබඳ දර්ශනය දුටුවේ,

   1/ ජෙරුසලමේදීය. 2/ බ්‍රිතානයයේදී ය. 3/ ජොප්පා වේදීය. 4/ සමාරියාවේදීය. 5/ නාසරතයේ දීය.

7. ඊශ්‍රායලයේ පිහිටි ගලීල මුහුද හැඳින්වෙන වෙනත් නම් අඩංගු නිවැරදි වර්ණය තෝරන්න.

   A- කින්නෙරෙත් මුහුද
   B- මළ මුහුද.
   C- ගෙනසෙරෙත් විල.
   D- මධ්‍යධරණී මුහුද.
   E- තිබේරියස් මුහුද.

   1/ A, B, C 2/ A, C, E 3/ B, C, D 4/ C, E, F 5/ B, E, F

8. ජුදෙව්වරුන්ගේ විශ්වාසය රැක ගැනීමට ධර්මශාලා හෙවත් සිනගෝග ආරම්භ වූයේ,

   1/ පර්සියානු යුගයේ 2/ අසිරියානු විප්‍රවාස යුගයේ 3/ ජොහොයාකීම් රජ යුගයේ 4/ ග්‍රීක යුගයේ 5/ බබිලෝනීය විප්‍රවාස යුගයේ

9. මිශ්‍ර විවාහ තහනම් කොට සමාජ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුගයේ දසයෙන් කොටස හිමි කරන ලද්දේ.
1/ විනයධරයන්ට ය. 2 / පූජකවරුන්ට ය. 3/ ලෙවීවරුන්ට ය.
4/ උත්තම පූජකයාට ය 5/ පරිසිවරුන්ට ය.

10. ක්‍රි. පූ. 37 දී රුකඩ රජතුමා ලෙස රෝමය විසින් නම් කරන ලද මහා හෙරොද් රජු රජතුමා කුමන ජාතිකයෙක් ද?
1/ ජුදා ජාතිකයෙක්. 2/ සමාරීය ජාතිකයෙක්. 3/ ඉදූමිය ජාතිකයෙක්.
4/ අම්ලෙක් ජාතිකයෙක්. 5/ මිසර ජාතිකයෙක් .

11. ජේසුස් වහන්සේ වහන්සේගේ උපතේ දී කුඩා පිරිමි දරුවන් මරණයට පත් කිරීම සඳහන් නව ගිවිසුමේ ග්‍රන්ථය
1/ ශුද්ධවූ මාක් සුභාරංචියයි 2/ශුද්ධවූ මතෙව් සුභ ආරංචියයි 3/ශුද්ධවූ ලූක් ශුභාරංචියයි
4/ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතයි 5/ ශුද්ධවූ ජොහාන් සුභාරංචියයි

12. පළමු මැවීමේ කතාවට අනුව මිනිසා දෙවියන් වහන්සේ සමඟ මැවීමේ කාර්යයට සම්බන්ධ වන්නේ,
1/ යාග ඔප්පු කිරීම තුළින් 2/ පාපයෙන් ඉවත්වීම තුළින් 3/ මැවිල්ල සංවර්ධනය කිරීම තුළින්
4/ පණ ඇති සියල්ලන්ට නම් තැබීම තුළින් 5/ මැවිල්ල පාලනය කිරීම තුළින්

13. ශුද්ධ බයිබලයට අයත් පොත් කිහිපයක් යුගල වශයෙන් පහත දක්වා ඇත. ඒවා අතුරින් පංච පුස්තකයට අයත් පොත් යුගලය කුමක්ද ?
1/ ජෝෂුවා හා වීරාවලිය 2/ ඔබදියා හා ජෝනා 3/ නෙහෙමියා හා එස්තර්
4/ රූත්ගේ කතාව හා එස්රා 5/ නික්මයාම හා ගණන් කතාව

14. මිනිස් දුබලතාව උපයෝගී කරගෙන දෙවියන් වහන්සේ ස්වකීය සැලැස්ම ඉදිරියට ගෙනයන බව දැක්වීමට සුදුසු උදාහරණයක් වන්නේ,
1/ ඊසාක්තුමාගේ ජීවිතය 2/ ආබ්‍රහම්තුමාගේ ජීවිතය 3/ මෝසෙස් තුමාගේ ජීවිතය
4/ ජාකොබ්තුමාගේ ජීවිතය 5/ දාවිත් ගේ ජීවිතය

15. ජුදා පාස්කු පිළිවෙතේ නුමුහුන් පූප භාවිතයෙන් අර්ථවත් වූයේ,
1/ වහල්කමේ වූ අමිහිරි දුක් ගායනා සිහිපත් කිරීමයි 2/ දෙවියන් වහන්සේ හා ඇති කරගත් ගිවිසුමේ සංකේතයයි
3/ දේව නියමය කඩිනමින් ඉටු කළ යුතු බවයි 4/ උත්සවයක් හෝ මංගල්‍යයක් වැනි සැමරීමකි
5/ බලාපොරොත්තු නොවූ අවස්ථාවක වහල්කමින් මිදීම සිහිපත් කිරීමයි

16. මැවීම පිළිබඳව උත්පත්ති පොතේ කතා දෙකක් සඳහන් වන නමුත්, එයින් අපට ඇති වැදගත්කම වන්නේ,
1/ මැවිල්ල වර්ධනය කිරීමට උදව් දීමයි
2/ දෙවියන් වහන්සේ විසින් ලෝකය මවා ඇති ආකාරය තහවුරු කර ගැනීමයි
3/ සියල්ලන්ටම පෙර ලෝකය මැවූ බව පෙන්වීමයි
4/ එයින් කියැවෙන දේවධාර්මික පණිවිඩය සොයා බැලීමයි
5/ එහි ඇති විද්‍යාත්මක සාධක සොයා බැලීමයි

17. මැවීම පිලිබඳ පළමු කතාව අඩංගු මුල් පිටපත තුළ සූර්යයා හා චන්ද්‍රයා නම් කර තිබුනේ නැත. ඊට හේතුව වූයේ,
1/ සූර්යයා හා චන්ද්‍රයා සඳහා නම් එම කාලයේදී භාවිතා නොවූ නිසාය
2/ මෙම කතා පුවත රචනා වී ඇත්තේ බහු දේවවාදී පරිසරයක බහුදේව වාදයට විරුද්ධව නිසාය
3/ මැවීමේ සංසිද්ධිය ආරම්භ කිරීමට පෙර සඳ හා හිරු පැවති හෙයිනි
4/ සූර්යයා හා චන්ද්‍රයාවෙනුවට ලොකු ආලෝකය හා කුඩා ආලෝකය යන නම් පහසු වූ නිසා ය
5/ සූර්යයා හා චන්ද්‍රයා මවන ලද්දේ මෙම දින හත අවසානයේ නිසාය

18. දෙවියන් වහන්සේ විසින් ඊසාක් හා ජොකොබ් වැනි නායකයන් තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වූයේ,
1/ ඔවුන් ආබ්‍රහම් ගේ පරපුරෙන් පැවත ඒමයි 2/ තමන් වහනේසේගේ ප්‍රේමයයි
3/ ඔවුන් නිර්භීත අය වීමයි 4/ එම නායකයන්ගේ ශුද්ධවන්ත බවයි 5/ ඔවුන් ලබා සිටි ජීවිත අත් දැකීම් ය

19. එලෝහිම් සම්ප්‍රදායට අනුව ඒක දේව වාදය ආරක්ෂා කිරීමේ නියමුවරු වූයේ,
1/ රජවරුන් 2/ නායක පූජකයන් 3/ දිවැසිවරුන් 4/ ආදිපිතෘවරු 5/ පූජකයන්

20. මැවීම පිළිබඳ දෙවන කථාවට පසුබිමක් සපයන්නේ,
1/ නික්මයාමේ සිද්ධිය 2/ බාබෙල් කොත 3/ ගිල්ගමේෂ් වීර කාව්‍යය
4 / බැබිලොනියානු වීර කාව්‍යය 5/ සුමේරියානු ජන කතා

21. ප්‍රසාද ස්නාපනයේ පෙර නිමිත්තක් වන්නේ,
1/ නික්මයාම 2/ නුමුහුන් පූප 3/ චර්මච්ඡේදනය 4/ මිදියුෂ පානය 5/ පාද දෝවනය

22. **හොඳ නරක** දැන ගැනීම යන්නෙන් අදහස් කරන්නේ,
1/ සමාව දීමේ කරුණාව 2/ අදූරු බලවේග 3/ වැඩිවියට පත්වූ බව
4/ පාපයේ හානිය 5/ දැන ගැනීමේ පූර්ණත්වය

23. දිවැසිවරයා යන්නට යෙදෙන ග්‍රීක වචනය වන්නේ,
1/ නබි 2/ මෂියාන් 3/ කොහේන් 4/ ප්‍රොෆේටිස් 5/ ආබද්

24. "ක්‍රිස්තෝස්" යන වචනයෙහි අර්ථය වන්නේ,
1/ ආලේප කරනු ලැබූ තැනැත්තා 2/ දෙවියන් වහන්සේ ගලවන්නා 3 / කැඳවනු ලැබූ තැනැත්තා
4/ දෙවියන් වහන්සේ සමඟ ගමන්කරන්නා 5/දෙවියන් වහන්සේ වෙනුවෙන් කතාකරන්නා

25. "එප්‍රාතා" යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
1/ මිසරයේ ජනතාවයි 2/ දාවිත් රජතුමා උපන් ගමය 3/ සීනයි ගිවිසුමේ හරයයි
4/ සාම රාජ්‍යයි 5/ දස පනතයි

26. දෙවියන් වහන්සේගේ හස්තයේ ඇති අකුලන පොතක් අනුභව කිරීමට ලබාදුන් දිවැසිවරයා වන්නේ,
1/ ආමොස් 2/ හොසියා 3/ යෙසායා 4/ ජෙරමියා 5/ එසකියෙල්

27. හොසියා දිවැසිවරයාගේ නමෙහි අර්ථය වන්නේ,
1/ දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක 2/ සමිඳාණන් ඔබ මුදා ගන්නා සේක
3/ සමිඳාණන් වහන්සේ යවනු ලබන සේක 4/ දෙවියන් වහන්සේ උසස් කල සේක
5/ සමිඳාණන් ගලවා ගන්නා සේක

28. ජීවිතයේ හරය, එහි ගැටලු පිළිබඳ විග්‍රහ කෙරෙන ප්‍රඥාවේ ප්‍රභේදය වන්නේ,
1/ අභිධාර්මික ප්‍රඥාව 2/ මිනිස් ස්වභාවය සම්බන්ධ ප්‍රඥාව 3/පවුල හා ගෝත්‍රික ප්‍රඥාව
4/ එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව 5/ රාජ්‍ය සභා ප්‍රඥාව

29. ගීතාවලිය සම්බන්ධව ගැඹුරු අධ්‍යනයක් ප්‍රථම වරට කරන ලද්දේ,
1/ ද වෙට්ට 2/ ආතර් වයිසර් 3/ ලොසිට් ප්‍රේගේ 4/ හර්මන් ගුන්කල් 5/ ඩිග්මන් මොවින්කල්

30. කරදර හා ආපදා අවස්ථා වලදී සහය පතා සිදුකරන ගීත හඳුන්වන්නේ,
1/ රාජකීය ගීත 2/ සියොන් ගීත 3/ විලාප ගීත 4/ ප්‍රශංසා ගීත 5/ තුති දීමේ ගීත

31. ජෙරමියා දිවැසිවරයා ප්‍රකාශ කළ ලෙස, සීනායි ගිවිසුම බිඳවැටීමට හේතුවී ඇත්තේ කුමක්ද?
1/ දෙවියන් විසින් අත්හැරීම 2/ ජනතාව විසින් නොසලකා හැරීම 3/ ගිවිසුම කඩ කිරීමෙන්
4/ ජනතාවගේ වරදින් 5/ ජනතාවගේ අවිශ්වාසය නිසා

32. ජීවතයේ හරය, එහි ගැටලු, විශ්වය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහයකට දැක්විය හැකි සුදුසුම උදාහරණය වනුයේ,
1/ ජෝබ්ගේ පොත හා සිරාක් 2/ සාලමොන් ගේ ප්‍රඥාව හා ධර්ම දේශකයා
3/ හිතෝපදේශය, සිරාක් 3/ ජෝබ්ගේ පොත හා ධර්ම දේශකයා
5/ සිරාක්, උපදේශකයා

33. දෙවියන් වහන්සේ ආශ්චර්යවත් ලෙස තම සෙනගට දෙන්නා වූ නව ජීවිතය පිළිබඳ සිත් ගන්නා රූපයක් ගොඩනැගීමට එසකියෙල් දිවැසිවරයා යොදා ගනු ලැබුවේ,
1/ චර්මඡේදනය 2/ වියලි ඇටකටු 3/ දේදුන්න 4/ ජලය 5/ ගිවිසුම් ජීවිතය

34. “දාසයාගේ ගීතය” දක්නට ලැබෙනුයේ සේවකයා සම්බන්ධ,
1/ හතරවන ගීතය 2/ තෙවන ගීතය 3/ පළමුවන ගීතය
4/ දෙවන ගීතය 5/මින් කිසිවකු නොවේ

35. දිවැසිවර ඉගැන්වීම් අතරින් ප්‍රධාන තේමාවක් වන්නේ,
1/ ධ්‍යානය 2/ හාස්කම් 3/ ගිවිසුම 4/ මෙසියානික සංකල්පය 5/දූත මෙහෙවර

36. මෙසියස් වහන්සේගේ උපත සඳහන් කිරීමට යෙසායා දිවැසිවරයා යොදා ගන්නා දිවැස් වැකිය වන්නේ,
1/ මෙසියස් වහන්සේ දාවිත් පරපුරෙන් පැමිණෙන සේක
2/ සියොන් පුරඟන ප්‍රීති ප්‍රමෝද වන්න
3/ සමිඳාණන් වහන්සේගේ පණිවුඩය .... වෙතට පැමිණියේය
4/ උන් වහන්සේගේ රාජ්‍යය දෙවියන් වහන්සේගේ රාජ්‍යය බැවින් එය සදාතනය
5/ අපට ළදරුවෙක් උපන්නේය

37. පුරාණයේ රජවරුන් සතු පරමාධිපත්‍ය පෙන්වීමට යොදාගත් ආමන්ත්‍රණය,
1/ ප්‍රතාපවත් දෙවිතුමාණෝ 2/සාමයේ කුමාරයාණෝ 3/ රාජ කුමාරයාණෝ
4/ සදාතන පියාණෝ 5/ අසිරිමත් අපදේශකයාණෝ

38. යාච්ඤාමය ගීතිකා 150 න් යුක්තව සැකසුනු පොතකි,
1/ පාවුලුතුමාගේ සංදේශය 2/ පංච පුස්තකය 3/ නික්මයාම පොත
4/ ගීතාවලිය 5/ දිවැසි ග්‍රන්ථ

39. එසේනිවරුන් ජීවත් වූ ස්ථානයක් වනුයේ මින් කුමක්ද?
1/ ගලීල කඳුකරයේ 3/ මළ මුහුද අසල ගුහාවල 3/ ගාසා තීරයේ
4/ ජෝර්දාන් ගඟ අසල 5/ කාර්මේල් කන්ද පාමුල

40. ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ පලස්තීනයේ පාලන බලය හිමි වූයේ
1/ බැබිලෝනියන්වරුන්ට 2/ ඊශ්‍රායෙල්වරුන්ට 3/ ග්‍රීකවරුන්ට
4/ රෝමවරුන්ට 5/ අසිරියන්වරුන්ට

41. ශුද්ධවූ පාවුළුතුමාගේ ප්‍රථම ධර්මදූත චාරිකාවේ අරමුණ වූයේ
1/ නව සභාවන්ගේ වර්ධනය වීමසීම හා අවශ්‍ය මග පෙන්වීම
2/ අන්තියෝකියේ සභාවේ දී ශුද්ධාත්මයාණන්ගෙන් ලද මග පෙන්වීම සාක්ෂාත් කර ගැනීම
3/ ජෙරුසලම් මන්ත්‍රණ සභා තීරය වෙනත් සභාවන් වෙතම දැන්වීම
4/ ඇදහිලිවතුන් කිතුනු ඇදහිල්ලේ සවිමත් කිරීම හා දිරිමත් කිරීම
5/ නව සභා සාමාජිකයින් දැනුවත් කිරීම හා දිරිමත් කිරීම

42. ජුදෙව් ජනතාවට ගෙවීමට සිදුවූ බදු වර්ග දෙක මොනවාද?
1/ ජල බද්ද හා දේව මාලිගා බද්ද
2/ ඉඩම් බද්ද හා දේව මාලිගා බද්ද
3/ රෝම අධිරාජ්‍යයාට ගෙවිය යුතු බද්ද හා දේව මාලිගා බද්ද
4/ ඉඩම් බද්ද හා ජල බද්ද
5/ ආහාර බද්ද හා රෝම අධිරාජ්‍යයාට ගෙවිය යුතු බද්ද

43. දේව රාජ්‍ය උරුම කර ගත හැකි "ආර්‍යය අෂ්ඨාංගික මාර්ග" වනුයේ,
1/ ප්‍රේම පාරමිතාවය. 2/ ස්වාමි වාක් ආරාධනයය. 3/ භාග්‍ය අටය.
4/ ඒකත්වය පිළිබඳ යැදුමය. 5/ දස පනතය.

44. වපුරන්නාගේ උපමාවට අනුව වපුරන්නා වපුරන බීජ යනු,
1/ දෙවියන් වහන්සේ වෙතින් පැමිණෙන පණිවිඩය.
2/ විවිධ දේශපාලනික නායකයන්ගෙන් ලැබෙන අභියෝගය.
3/ මිනිස් සිත්හි ඇතිවන නපුරු සිතුවිලිය.
4/ සරු අස්වැන්නක් ලබා ගත හැකිබීජය.
5/ පල හටගන්නට නොහැකි තැන්වල වැටුණු බීජය.

45. දැහැමි දෙවි කෙනෙකුගේ පාලනයට නතුවන ලෝකය තුළ දුදනන් වැජඹෙන්නේ කෙසේද යන පැනයට අපට පිළිතුරු ලබා දෙනුයේ,

1/ දැල පිළිබඳ උපමාවෙනි. 2/ නිධානය පිළිබඳ උපමාවෙනි. 3/ කිරිඳි පිළිබඳ උපමාවෙනි. 4/ මුහුන් පිළිබඳ උපමාවෙනි. 5/ වපුරන්නා පිළිබඳ උපමාවෙනි.

46. මනුෂ්‍යයා වහල් වී ඇති සතර ආකාර වහල්කම් ලෙස හඳුන්වන්නේ,

1/ මත්ද්‍රව්‍ය ,ලෙඩ රෝග, මරණය, දුෂ්ඨ ආත්මවලට නතු වීමය.
2/ ස්වභාවික බලවේග, දුෂ්ට ආත්ම,මරණය, මත්ද්‍රව්‍ය.
3/ ශාරීරික දුබලතා, මත්ද්‍රව්‍ය ,ලෙඩ රෝග, මරණය.
4/ ශාරීරික විකෘතිතා මත්ද්‍රව්‍ය,මරණය ,ලෙඩ රෝග.
5/ මරණය ,ලෙඩ රෝග, ස්වභාවික බලවේග, දුෂ්ඨ ආත්ම වලට නතුවීම.ය.

47. ධර්මශාලා ප්‍රධානියාගේ දුව සුව කිරීමට අදාළව ජේසුස් වහන්සේ පැවසූ වදන් වනුයේ ,

1/ "අහක්ව යන්න ඇය නිධන්භීය මැරී නැත"
2/ "ඇය නිදන්නීය.ඇය මැරී නැත අහකට යන්න.
3/ " අහකට යන්න දැරිය මැරී නැත ඇය නිදන්නීය"
4/ "මැරී නැත අහක්ව යන්න .ඇය නිදන්නීය"
5/ " අහකට යන්න ඇය නිදන්නීය".

48. ස්වභාව ධර්මය හා සම්බන්ධ වන ප්‍රාතිහාර්යයක් වනුයේ,

1/ සුදර්ශන දොරටුව අසල සිටි කොරා සුවපත් කිරීමය.
2/ මාරුත දමනය ය.
3/ දිය උදර රෝගියා සුව කිරීමය.
4/ අතක් පණ නැති මිනිසා සුවපත් කිරීමය.
5/ ලාදුරු රෝගීන් දසදෙනා සුවපත් කිරීමය.

49. ශුද්ධවූ පාවුලු තුමා ‘‘අගපේ‘‘ යන වචනයෙන් ඉදිරිපත් කරනුයේ,

1/ නිමක් නොමැති බලාපොරොත්තුවයි.
2/ ප්‍රතිලාභ නොතකා අයහපත කරන්නාට යහපත කිරීමයි.
3/ ඥානය අභිබවා යන විශ්වාසයයි.
4/ ප්‍රතිලාභ ලබාදෙන්නට පමණක් යහපත කිරීමයි.
5/ අයහපත කරන්නන් වෙනුවෙන් දිවැස්වැකි පැවසීමයි.

50. පිලිප්පි 2/ 5-11ට අනුව ක්‍රිස්තුස් වහන්සේ තුළ කැපී පෙනෙන ගුණාංග වන්නේ

1/ බලාපොරොත්තුව හා සදාතන ජීවනයයි.
2/ ප්‍රේමය හා කැපවීමයි.
3/ දිළිඳුකම හා කීකරුකමයි.
4/ බැහැපත්කම හා කීකරුකමයි.
5/ යුක්තිය හා සාධාරණත්වයයි.